

## 'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු

| | | |
|---|---|---|
| 59 වන කාණ්ඩය | බු.ව. 2560 වෙසක් මස පුරපසළොස්වක ද<br>ව්‍ය.ව. 2016 මැයි මස 21 වන ද | 01 වන කලබ |



# වෙසක් මිහිර

බුදු සිසිලේ කරුණාවේ
මිහිර ගලයි දියදායේ
ජය සිරි මහ බෝ සෙවණේ
සත සිත කුලුණින් නෑවේ

බුදු මඟුලින් උදම් වෙලා
මුළු ලෝකෙම සිහිල් වෙලා
හැම සිතක ම සතුට වෙළා
මෙත් සිතිවිලි එළිය කළා

නුඹේ සිතේ පියුම් සුවඳ
කුසල් සඳේ සිහිලස විඳ
පැතිරෙයි දස අතෙහි විහිද
ආසිරි සුව දෙමින් නොමඳ

**- අනඳ**



# වෙසක් පුනු පොහොය

**අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමිපාණන් වහන්සේ විසිනි**

සම්බුද්ධ චරිතයත් බුද්ධ ශාසනයත් පිළිබඳ ව මේ උතුම් පොහොද සිදු වූ වැදගත් දේවල් බොහෝ ය. ඒ හැම තොරතුරු දැන් මහජනයා අතර ඉතා ප්‍රසිද්ධ ය. අබෞද්ධ ජනතාව අතරත් වැඩිදෙනා දනිති. එබැවින් ම මෙ දවස බෞද්ධයන්ගේ උසස් ම පූජෝත්සව දිනය මෙන් සම්මත වූයේ බුදු සසුන මෙහි පිහිටි මුල් අවධියෙහි සිට ම ය. ඒ බව දුටුගැමුණු මහ රජුහුගේ සූවිසි වෙසක් මහපුද කතා ආදි ඓතිහාසික වාර්තාවන්ගෙන් හෙළි වේ.

එසේ හෙයින් අද යෙදෙන වෙසක් පුන් පොහෝ දිනයෙහි ද අපේ මුතුන් මිත්තන් කළා සේ බුදු පුද උලෙළ පැවැත්වීම අපට පරපුරෙන් උරුම වූ යුතුකමෙක් වේ. බුදුන් වහන්සේ පිරිනිවන් පානා සමයෙහි අනඳ හිමියනට "ආමිස පූජා තිබිය දී ප්‍රතිපත්ති පූජා කළ මැනවැ"යි වදළ බස ද සිහිකොට, භක්ති ප්‍රබෝධය පිණිස මල් පහන් ආදියෙන් හා සැරසිලි ආදියෙනු ත් ප්‍රමාණවත් වැ ආමිෂපූජාත් කළ යුතු වුව ද, විශේෂයෙන් පිළිවෙත් පුද

පැවැත්වියැ යුතු මැ යැ. එහිදු,

**ගිහියන් විසින් නම්:** පන්සිල් හෝ අට-දස සිලින් හෝ සිල්වත් වැ දන ශීල භාවනාවන්හි යෙදී විශේෂයෙන් බුද්ධානුස්සති භාවනායෙහි යෙදී, බුදුගුණ පිළිබඳ බණකතා අසමින්, එබදු සාකච්ඡා කරමින්, වන්දනා මාන පැවැත්වීමට දගැප් බෝමළු පිළිමගෙවල් ආදි සිද්ධස්ථානයන් කරා සැදැයෙන් බුදු ගුණ සිත සිතා යමින් ඒ පිළිවෙතින් බුදුරුවන් පිදියැ යුතු යැ.

**පැවිද්දන් විසින් නම්:** සිවු පිරිසිදු සිල් සුපිරිසිදු කැරැ ගෙනැ ශීල විශුද්ධියෙහි පිහිටා "බුදුන් වහන්සේ පැනැවූ පැවිදි පිළිවෙත්හි සුපිහිටියෙමැ"යි නිරාමිෂප්‍රීතියෙන් ප්‍රීත වෙමින්, බුද්ධානුස්මෘති භාවනාවෙන් සිත් සතන් පිනවමින්, ඒ බුදුන් වහන්සේ වදළ අනිත්‍ය දුක්ඛ අනාත්ම විදර්ශනාභාවනා ත් පූර්වභාග මූල කර්මස්ථාන වශයෙන් වඩමින්, බුදුගුණ පිළිබඳ ධර්ම සාකච්ඡා පවත්වමින්, එබඳු ම බණ දෙසමින්, කල් ගෙවා එපිළිවෙතින් බුදුරුවන් පිදියැ යුතු යැ.

මේ දිනය දැන් නිදහස් නිවාඩු දවසක් හැටියට සම්මත වැ තිබෙන හෙයින් ගිහි පැවිදි දෙපස විසින් නොයෙක් විට ම විවේක තැනකට වී, බෞද්ධ ප්‍රතිපත්ති අතින් තම තමාගේ ඇති අඩු පාඩු දුබලකම් සෘජු වැ මැ සලකා බලා, අද පටන් ඒ හැම දොස් හැරැ, අඩු පාඩු සපුරා, සුපිළිපන් වන්නට තරයේ ඉටා ගතැ යුතු යැ. ගිහි පැවිදි දෙපසැ මැ බාලපරම්පරාවගේ බණ දහම් ඉගෙනීමත් ගුණ

දහම් පුහුණු කිරීම ත්, ශ්‍රද්ධාභිවර්ධනයත් වන පරිදි ක්‍රියා කරන්නට ත් ඉටා ගතැ යුතු යැ. ධර්මද්වීපයැ යි පතළ මේ කුඩා දිවයිනේ දැන් කැරෙන මැර වැර සැහැසිකම් මැඩ ලන්නට ත්, "සිල්වතුන්ගෙන් පිරුණු ලක්බුදුසසුනැ"යි චිරප්‍රසිද්ධ වැ තුබුණු මෙරටැ දැන් පැවිදි වූ ඇතැම් අප්‍රතිපන්න දුෂ්ප්‍රතිපන්නයන්ගෙන් දිනෙන් දිනැ වැඩි වැඩියක් කෙලෙසන සැටි සලකා සංවේගප්‍රාප්ත වැ, අද පටන් ඒ සසුන් මල හරවා පිරිසිදු බුදු සසුන් මෙහි නැවැතත් ඇති කරන්නෙමැ යි ත් ඉටා ගතැ යුතු යැ. මේ ඈ නියෙන් මේ උතුම් දින ගෙවා ඒ හැම පිනින් උතුම් නිවන්සුව පතාගතැ යුතු යැ.

**හැමෝ ම සුවපත් වෙත්වා !!**

**සබ්බදා සබ්බසත්තානං**
**හිතාය ච සුඛාය ච**
**උයයුත්තෝ අකිලාසූ ච**
**අහෝ අච්ඡරියො ජිනෝ**

හැමදා හැම සතුන්
හිත සුව පිණිස නිබඳ ව
විඩා නො තකා වෙහෙසුණු
අනේ බුදු හිමි පුදුම යි



# හොඳ දරුවෝ ලොවට හොඳ මඟ පෙන්වති

පූජ්‍යපාද පඹුරන මෙත්තෙය්‍ය හිමිපාණන් වහන්සේ විසිනි.

**බුදුපියාණන් වහන්සේ වනාහි එක ම දරුවකු ඇති මවක එම දරුවා රක්නා සේ ද, එක ඇසක් ඇති මිනිසකු එම ඇස රක්නා සේ ද, රෑ දවල් දෙක්හි ලෝකයා ආරක්‍ෂා කරන සේක.**

අද මුළු ලොව ම දුකින් පිරිලා ය. සැනසිල්ල ඇත්තේ මහා කාරුණික වූ සම්මා සම්බුදු පියාණන් වහන්සේ සෙවණෙහි වෙසෙන මේ ඉතා පින්වත් බෞද්ධ දරුවනට පමණෙකි. ඉදින් තුනුරුවන් සරණින් සැනසිලි ලත් හොඳ දරුවෝ තමන් ලත් ඒ මහා සැනසිල්ල වෙන ආගම්වලත් වෙන ජාතිවලත් සියලු දෙනහට ම දෙත්වා! ලෝකයා ගේ සියලු දුකට හේතුව බණ දහම් නොදැනීමත් ගුණදහම් නොපිරීමත් ය. එබැවින් පින්වත් දරුවෝ මුළු ලොවට බණ දහම් කියා දී ගුණ දහම් පුරන සැටි ද පෙන්වත්වා! පින්වත් දරුවන් එසේ කළහොත් මුළු ලොවට අද ම ස්වර්ණ යුගයක් උදාවෙයි. මහාචාර්ය වින්සන්ට් ස්මිත් මහතා **"පුරාතන ජම්බුද්වීපයේ ඉතිහාසය"** නමැති පොතෙහි බුදු දහමෙන් සියලු සත්ත්වයනට ම වූ මහ

සෙත විස්තර කෙරෙයි. එද දඹදිව තත්ත්වය ස්මිත් මහතා මෙසේ දක්වයිඃ

"රටවාසීහු බුදුරජාණන් වහන්සේගේ ධර්මයට අනුව ජීවත් වූහ. ඔවුහු සතුන් නො මැරූහ. මත්පැන් නො බීවෝ ය. මස් කෑමට ඌරු කුකුළු ආදී සතුන් ඇති නො කළහ. ගවයන් නො මැරූහ. රටේ මස්කඩ හෝ තැබෑරුම් හෝ නො වූහ. මරණීය දණ්ඩනය ද නො වී ය."

අනේ මුළු ලොවට ම ඒ සෙත වේවා! පින්වත් දරුවන් ගේ උතුම් වූ මවු බිම වන මේ ශ්‍රී ලංකාද්වීපය ගැන ද පෙර ලෝකයේ පැතුරුණු කීර්ති ශබ්දය මෙ සේ යඃ " ධර්මද්වීපය වනාහි චෛත්‍ය මාලායෙන් අලංකෘත ය. කාෂාය වස්ත්‍රයෙන් බබළයි. මල් පල'රම්වලින් හොබනේ ය. කැමැති තැනෙක වාඩි වී විවේක ගන්නට හෝ නිදන්නට හෝ පිළිවන. දේශගුණය සෞම්‍ය ය. වාසය කිරීමට සුවදායක තැන් බොහෝ ය. ධර්මද්වීප වාසීහු ද ඉතා කරුණාවත් සත්පුරුෂයෝ ය. නිතර බණ අසන්නට ද ලැබේ. ධර්මද්වීපය හැම අතින් ම උතුම් රටෙකි."

උතුම් දූ පුතුනි, අද මුළුලොවට පිහිටවන එක ම රට නම් පෙර රජුන් විසින් බුදුපියාණන් වහන්සේට පුදන ලද මේ ධර්මද්වීපය යි. "ධර්මරාජයාණන් වහන්සේ තුන් වරක් වැඩම කිරීම කරණ කොට ගෙන මේ ලංකාද්වීපය ධර්ම නැමැති පහනින් බැබළුණේ සත්පුරුෂයන් විසින් පුදනලද්දේ ය"යි මහාවංශ පළමුවන පරිච්ඡේදයෙහි සඳහන් වේ. ඉදින් මහ පින් ඇතිව මේ උතුම් ධර්මද්වීපයෙහි උපන් දරුවෝ මේ ධර්මද්වීපයට ඇති මහා සම්පත්තිය

වූ අප බුදුපියාණන් වහන්සේගේ ධර්මය මුළු ලොවට දෙත්වා! අපරදිග රටවල් දුසිරිතෙන් පිරිලා ය. ඉංග්‍රීසි ජාතිය ආහාර සඳහා කරන වියදම තරම් ම මුදලක් දුම් බීමෙන් අපතේ හරියි. සමහර ඉංග්‍රීසි තරුණයෝ දුම් බීම නිසා වයස තිහ වන්නටත් පෙර සම්පූර්ණයෙන් ම අන්ධ වෙත්. අවරදිග රටවල ළදරුවන් හට බොන්නට අද තන කිරිත් නැත. ඊට හේතුවත් අවරදික් වාසීන්ගේ බේබදුකම බව වෛද්‍යවරයන් විසින් සොයා ගෙන තිබේ. යම් පියකු විසින් මත්පැන් බොනු ලැබුවහොත් ඔහුගේ දුව ඉතා දුර්වල වෙයි. තම දරුවනට දෙන්නට ඒ දුවට කිරි නැති වෙයි. එපමණක් නොව මේ බේබදුකම නිසා අවරදිග රටවල පිස්සන් කොටු ද හිරගෙවල් ද දිනෙන් දින වැඩි වෙයි. අප බුදුපියාණන් වහන්සේ වනාහි 'අහෝ! මා උදසීන වුවහොත් මුළු ලොව ම නසියි. ලෝකයාහට මත්පැන් නො බොන සේ අවවාද කරමි' යි සිතා නොයෙක් ආකාරයෙන් බණ වදරා ලෝවැස්සන් මත් පැන් බීමෙන් බේරාගත් සේක. ඉදින් පින්වත් හොඳ දරුවෝ ද බුදුපියාණන් වහන්සේ අනුගමනය කෙරෙමින් අසරණ ලෝකවාසීන් මේ අන්තරායකර වූ මත් පැන් බීමෙන් බේරා ගනිත්වා!

තුනුරුවනට දිවිපිදූ ධර්මද්වීප වාසී මේ හොඳ සිංහල බෞද්ධයෝ නම් ලෝකයේ ඉතා ම ගුණවත් කරුණාවත් මනුෂ්‍යයෝ යයි දෙව් මිනිසුන් අතර ප්‍රකට ය.

එහෙත් අවරදිග නම් මෙබඳු කරුණාවක් නැත. අවරදික් වාසීහු අශ්වයන්ගෙන් පිළිවන් තරම් වැඩගෙන අන්තිමේ දී ඒ අශ්වයන් මරා මස්වලින් සුප් සාදගෙන බොති.

එබැවින් අවරදික් වැසියන්ට විශේෂයෙන් ම කරුණාව ඉගැන්විය යුතු ය. ධර්මාශෝක රජතුමාණෝ තුනුරුවනට දිවි පුද ධර්මයෙහි පිහිටා ආසියා අප්‍රිකා සහ යුරෝපා යන මහාද්වීප තුනෙහි ම අසරණ තිරිසන් සතුන් හටත් මිනිසුන් හටත් ආරෝග්‍ය ශාලාවන් පිහිටුවූහ. මිසරය සහ ග්‍රීසිය ආදි ඉතා ඈත රටවලට ද ධර්ම දූතයන් වහන්සේ යැවූහ.

තව ද එම මහරජතුමාණෝ "මේ ලෝකයෙහි යම්තාක් කල් මාගේ දරු මුනුබුරෝ වෙත් ද යම්තාක් කල් ඉර හඳ බබළා ද-ඒ තාක් කල් ම සියලු මනුෂ්‍යයෝ ධර්ම මාර්ග යෙහි පිළිපදිත්වා"යි ගලෙහි ලියා තැබූහ. ඒ ධර්මාශෝක මහරජතුමන් ගේ දරු මුනුබුරෝ නම් මේ ධර්මද්වීපවාසී උත්තම වූ ආර්යසිංහල බෞද්ධ දරුවෝ ය. ලෝකයාගේ සැනසිල්ලත් පිහිටත් මේ හොඳ දරුවෝ ය.

"මිනිසුන් ගේ ඉතා උතුම් වස්තුව නම් ගුණ නුවණැති දරුවෝ ය"යි අප බුදුරජාණන් වහන්සේ වදාළ සේක. හොඳ දරුවකුගෙන් තම මවුපියන්ටත් සොයුරු සොයුරියන් ආදීන්ටත්, ගෙදරටත්, නෑ මිතුරන්ටත්, ගමටත් රටටත් සියලු දෙව් මිනිසුන්ටත් අපමණ සෙත් වැඩ සැලසෙන බව තිලෝගුරු වූ බුදුරජාණන් වහන්සේ වදාළ සේක. තුනුරුවනට දිවිපිදූ යහපත් මවුපියවරු ද තමන්ගේ ඉතා ම අගය ඇති වස්තුව දූ දරුවෝ ය'යි බුදුරජාණන් වහන්සේ වදාළ වචනය නිති සිහිපත් කෙරෙත්මැයි. ධර්මාශෝක මහරජතුමෝ ද එසේ සලකා තමන්ගේ ඉතා උතුම් වස්තුව වූ දූ දරුවන් මුළු ලොවට යහපත පිණිස ශාසනයට පූජා කළහ. අප ගේ විහාරමහා දේවී තොමෝ

ද තමා ගේ ඉතා උතුම් වස්තුව වූ දරු දෙදෙනා ඉතා ම ආදරයෙන් වඩා ඔවුන් සම්බුද්ධ ශාසනයා ගේ සේවය පිණිස තුනුරුවනට දසකොට දුන්නා ය. මවුපියන් විසින් තුනුරුවනට පුදන ලද සිරිසඟබෝ කුමර තෙමේ ද,

**"ඉමං සරත්තප්පිසිතං සරීරං**
**ධාරෙමි ලෝකස්ස හිතත්‍ථමෙව"** යනුයෙන්

**"ලෙයින් හා මසින් සැදුණා වූ මේ ශරීරය ලෝකයාගේ හිත සුව පිණිස ම දරමි"**යි පවසා සිය රජයත් හිසත් දන් දී සව් සතුන් සියලු දුකින් මුදා පරම සුවපත් කරනට පැතී ය. පෙම්බර පින්වත් දරුවෝ ද එ සේ ම සකල ලෝකයා සියලු දුකිනුත් මුදා සුවයෙහි ද පිහිටුවා සව්සත්නට මහ සෙත ම සිදු කරනට ඉටා ගනිත්වා!

**සියලු සත්ත්වයෝ නිදුක් නිරෝග සුවපත් වෙත්වා!**

**බුදු සසුන බැබළේවා!**



# අපිත් දස පාරමී සපුරමු

පුෂ්පා ජයවර්ධන නැන්ද විසිනි

යහ ගුණෙහි ඇලෙමින
බොදු පිළිවෙතෙහි බැඳෙමින
සසර දුක දැනගෙන
පුරමු දස පාරමී දිරියෙන

තම හට අයිති දේ
අනුන් යහපත සලකා
අත්හැර සොම්නසින්
පුරමු දානය පාරමී ලෙස

තුන් දොර හික්මවා
තමා උපමා කරගෙන
සුසිරිත් සිල් ම සපුරමු
සීල පාරමිතාව එය වෙයි

නිති දැක සසර දුක
නොඇලෙන සිතෙහි සුව දැක
ඇලුම් අත්හැර නික්මෙමු
පුරා නික්මෙන පාරමී සික

ලොව සැබෑ දැකුම යි
හරි දේ දකින නුවණ යි
කෙලෙසුන් පැරදුම යි
එය ම පැන පාරමී පිරුම යි

කරන සැම කාරිය
ඉටු වනුව ගෙන වීරිය
ලබා තෙද සූරිය
පුරමු අපි පාරමී වීරිය

ගැටෙන තැන ඉවසුම
දේය යහපත සැනසුම
හිමි වෙයි සන්සිඳුම
එය ම වෙයි පාරමී ඉවසුම

බොරුවෙන් මිදුණු බව
ඇත්තෙහි ම ළබැඳුණු බව
සිතේ ඇද නැති බව
දනුව එය සස් පාරමී බව

සුසිරිත රකින්නට
මතු මතු දියුණු වන්නට
පසු නො බැස පෙරට ම යමු
එය ම අදිටන් පාරමී වේ

සියලු ලොව සත වෙත
පුදමු අප ගේ මෙත් සිත
වඩමු නිති යහපත
එයයි මෙත් පාරමී මා පුත

අටලෝ දහම වෙත
කම්පිත නොවේ නම් සිත
මැදහත් ව සිත සම බර
උපෙක්ඛා පැරුමට ම වෙයි දෙර

තෙරුවන් පිහිට ඇති
බෝසත් මගට රිසි ඇති
දරු - දැරියනි පිනැති
පුරනු මේ දස පෙරුම් යහපති



# වෙසක් පොහොයට දැහැමි දන්සලක් දෙමු

සිරි වජිරාරාම දහම් පාසලේ නියෝජ්‍ය ප්‍රධානාචාර්ය
පූජ්‍යපාද මීගොඩ සුබිත හිමියන් විසිනි.

දන් දීමට සිංහල ජාතිය තරම් හපන් ජාතියක් ලොවේ කොහේවත් නැතැයි කිවහොත් එය නිබොරු ය. මහින්දාගමනයේ සිට බුදු දහම රාජ්‍යත්වය හා බැඳී පැතිරී ගියා සේ ම දානය ද රජ මැදුරේ සිට දුගී පැල දක්වා විහිදී පැතිරී ගිය අයුරු පැරණි අටුවා කතා කියවීමේ දී දැන ගත හැකි ය. පුරාණ සිංහල රජ දරුවෝ දුගී මඟී යාචකාදීන්ට නොමිලේ ආහාර ලබා ගත හැකි පරිදි තැන තැන දන්සල් පිහිටවූහ. මෙලෙස දන්සල් පිහිටවූයේ දහස් ගණන් භික්ෂු සංඝයාට නිති පතා දන් දීමට අමතරව ය.

සිංහලයා සතු ඒ අපූරු ගුණය වෙසක් පොහෝ දින ආදී විශේෂ අවස්ථාවල දී වඩ වඩා නැඟේ. වෙසක් පොහෝ දා තැනින් තැන මහ දන්සල් පැවැත්වීම සුලබ දසුනකි. අපට එය සුලබ දසුනක් වුව ද ලෝකයේ නම් දකින්නටවත් නොමැති දසුනකි. එනම් මහ මඟ යනෙන මහජනයා මහත් ඕනෑකමින් නතර කරවමින් නොමිලේ ආහාරපාන දීමයි. එබඳු සිරිත් ලොව කොහේවත් අප අසා නැත. එබැවින් සිංහලයා සතු මෙම දන්දීමේ ගුණය

ආරක්ෂා කර ගත යුතු දින දින දියුණු කර ගත යුතු ගුණයකි.

දන්දීමෙන් ලැබෙන කුසලය වඩාත් මහත්ඵල කර ගැනීමට නම් නිවැරදිව දන් දෙන අයුරු පිළිබඳව දත යුතු ය. අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයේත් අට්ඨක නිපාතයේත් "සප්පුරිසදාන" නමින් සූත්‍ර දෙකක් හමු වේ. එම සූත්‍රවලට අනුව දානයක් සත්පුරුෂ බවට පත්වන්නේ ශ්‍රද්ධාවෙන් දන් දීමෙනි, සකසා සපුරා දීමෙනි, නිසි කල්හි දීමෙනි, දෙන දෙයෙහි බැඳීම් නැතිව දීමෙනි, තමා ද ලෝකයා ද නොපෙළා දීමෙනි. තව ද පිරිසිදු දෙය ම දිය යුතු ය. ප්‍රණීත දෙය ම දිය යුතු ය. සුදුසු කල්හි දිය යුතු ය. කැප වූවක් දිය යුතු ය. පරීක්ෂා කොට දිය යුතු ය. නිරතුරු දිය යුතු ය. දෙන විට සතුටු සිතින් දිය යුතු ය. දුන් පසු ඒ ගැන සිතා සතුටු විය යුතු ය.

දන්සල් පැවැත්වීමට වෙසක් සමය තරම් සුදුසු කාලයක් බෞද්ධයාට නැත. සසර පුරා අසම සම දාන පාරමිතාවක් පුරමින් ඇස් හිස් මස් ලේ දන් දුන් තථාගතයන් වහන්සේ ගේ තෙමගුල් දිනය දන් දීමට ඉතා සුදුසු නිමිත්තකි. අද වන විට බෞද්ධයන් පමණක් නොව අන්‍ය ජාතික අන්‍ය ආගමිකයෝ ද වෙසක් සමයේ මහ දන්සල් පවත්වති. ඉතා වෙහෙස වී මහා ධනයක් වැය කරමින් සංවිධානය කරන මෙම දන්සල් වඩා අර්ථ සම්පන්න කර ගැනීම පිණිසත් දානය මහත්ඵල මහානිසංස වීම පිණිසත් පහත කරුණු පිළිබඳ සැලකිලිමත් වීම අගනේ යැයි අපි සිතමු.

- දන්සලක් දීම සඳහා ආධාර එකතු කරන්නේ නම් එය බඹරකු මල නොතළා රොන් ගන්නා සේ ඉතා

ම දැහැමිව විය යුතු ය. සුභදශීලීව නිවසට ගොඩ වී පරමාර්ථය පැහැදිලි කොට පින්කමට දායක කර ගැනීමේ අරමුණින් ම කාට කාටත් හැකි අයුරින් මුදල් සම්මාදම් කරනු විනා ශබ්ද විකාශන බැඳ මහ හඬින් නම් ප්‍රචාරය කරමින් ගීත කියමින් කරන සම්මාදම අගය කළ නොහැකි ය. එම මුදල හැකිතාක් දැහැමි ක්‍රමවලින් මුදල් සම්පාදනය කරන්නන් ගේ ආධාර උපකාර නම්, එය දාන වස්තුවේ හෙවත් දෙන දෙයෙහි පිරිසිදු බවට හේතු වේ. ඇතැමෙක් නා නා නොදැහැමි අයථා ක්‍රමවලින් සම්පාදනය කරන මුදලින් වසරකට වරක් දන්සලක් දෙති. පව් ගෙවෙන්නට මෙන් සිදු කරන එවැනි දන්සල් ද අගය කළ නොහැකි ය.

- දෙන දේ කුඩා වුවත් මහත් වුවත් ඉතා පිරිසිදුව සම්පාදනය කර ගත යුතු ය. කාට කාටත් සතුටින් පරිභෝජනය කළ හැකි දෙයක් ඉතා පිරිසිදුව පිළියෙල කොට දීම වැදගත් ය.

- දන්සල දෙන ස්ථානය ද ඉතා පිරිසිදු නිදහස් තැනෙක බිම මනාව සකස් කොට නොතෙමෙන සේ ආවරණ යොදා බෞද්ධ කොඩියක් වැනි ආගමික සංකේතයකින් චාම්ව සරසා සිත් පහන් වන සේ පිළියෙල කළ යුතු ය.

- දන්සල දෙන අවස්ථාවේ අවශ්‍ය නම් සිත් නිවී සැනසෙන බුදුගුණ ගීත, බුදු ගුණ කවි සජ්ඣායනා, ගාථා සජ්ඣායනා වැනි හඬ පටි මඳ හඬින් විකාශය කරනු විනා කාමෝද්දීපන ගීත සහ සංගීත ආදිය මහ

හඬින් ප්‍රචාරය කිරීම නම් දැහැමි දන්සලකට නොගැළපේ.

- ආහාර පිළිගන්වන සංවිධායක පිරිස ද සුදු හෝ ඉතා චාම් වස්ත්‍රයෙන් ශරීරය ම ආවරණය වන සේ හැඳ ප්‍රසන්නව සිටිය යුතු අතර හැකි නම් පිරිසිදුභාවය වඩ වඩා ආරක්‍ෂා වීම පිණිස අත් වැසුම් මුව වැසුම් ආදිය භාවිත කිරීම ද මැනවි. ආහාර පිළිගැන්වීම ඉතා කාරුණික වැඩි කලබල නැතිව කරනු විනා මහත් හඬ නගමින්, උසුළු විසුළු වදන් කියමින් ඕනෑවට එපාවට නොකළ යුතු ය. අවසානයේ තෙරුවන් සරණයි! වැනි ආශීර්වාදයකින් ද සංග්‍රහ කිරීම ආහාර සංග්‍රහයේ අගය වැඩි කිරීමට හේතු වනු ඇත.

- දන්සල විවෘත කිරීම සඳහා මහා සංඝරත්නය වැඩම කරවීමට වඩා දැහැමි බෞද්ධ නායකයකු හෝ කාගේත් ගෞරවයට පාත්‍ර වූ වැඩිහිටියකු සම්බන්ධ කර ගැනීම සුදුසු ය. ස්වාමීන් වහන්සේලා පිළිබඳ දන්, පැන්, ගිලන්පස වළඳන කාලවේලාවන්, කැප අකැප දෑ ආදිය වෙනුවෙන් ශික්‍ෂාපද තිබෙන බැවින් උන් වහන්සේලාට දන්සලක් විවෘත කිරීමට ආරාධනා කිරීමේ දී ඒ පිළිබඳ බෙහෙවින් සැලකිලිමත් විය යුතු ය. නැතිනම් නොදැනුවත්ව හෝ සංඝ ගෞරවයට හානි විය හැකි ය. ස්වාමීන් වහන්සේ නමක් දන්සල අවසානයේ පුණ්‍යානුමෝදනාවට වැඩම කරවීම වඩා යෝග්‍ය වේ. දේශපාලනඥයින් දන්සල විවෘත කිරීමට සම්බන්ධ වීමෙන් ද දන්සලක පොදු දැහැමි අරමුණ වෙනුවට පෞද්ගලික අදහස් ඉස්මතු වීමේ අවදානමක්

ඇත.

- දන්සලට පිරිස ගෙන්වා ගැනීමට බෞද්ධ කොඩිය භාවිත කිරීමෙන් එම ගෞරවනීය සංකේතය අවභාවිතයට අගෞරවයට ලක්වීමේ අවදානමක් ඇත. එම නිසා ඒ වෙනුවට කහ පැහැය වැනි චාම් වර්ණයකින් යුතු කොඩියක් හෝ දන්සලේ නම සඳහන් (උදා : බත් දන්සල, සිසිල් පැන් දන්සල) පුවරුවක් වැනි යමක් භාවිත කළ හැකි ය. එය ද ඉතා සංසුන්ව කළ යුත්තක් මිස පාරට පැන රළු ලෙස වාහන නැවැත්වීම නො මැනවි.

- ඇතැම් අය දන්සල් දෙන විට බීමත්ව විනෝදයක් සේ සලකා එය කරති. එසේ දන්සල් දෙනවාට වඩා නොදී නිකම් සිටින්නේ නම් එය දෙපසට ම හිතකර දෙයකි.

- දන්සල අවසානයේ දන්සල් භූමියත් අවට පරිසරයත් හොඳින් පිරිසිදු කිරීම අත්‍යවශ්‍ය වේ. අනතුරුව සංවිධායක පිරිස හා ආධාර කළ පින්වත් පිරිස ද කැඳවා කාටත් පහසු වෙලාවක ස්වාමීන් වහන්සේ නමක් වැඩමවා කෙටි පුණ්‍යානුමෝදනාවක් කරවීම වඩ වටිනේ ය. එවිට කළ පින්කම මෙනෙහි කොට කවුරු කවුරුත් සතුටු වනු ඇත. හැකිනම් එකතු වූ ආධාරයන් හා වියදම් කටයුතු සිදු වූ ආකාරය පිළිබඳ අයවැය සටහනක් පිරිස අතට ලබාදීමෙන් මුදල් ගනුදෙනුවලට අදාළ විනිවිද භාවය පෙන්නුම් කිරීමට හැකිවීමෙන් සියලු දෙනා අතර ඇති හිතෛෂිභාවය සහ අවංකභාවය වර්ධනය කර ගත හැකි ය. නැවත

දන්සලක් දීමේ කටයුත්ත පහසුවෙන් සංවිධානය කර ගැනීමට එය මහත් රුකුලක් වනු ඇත. එසේ නොමැතිව දන්සල අවසානයේ සංවිධායක පිරිස මත්පැන් ආදිය පානය කොට විනෝද වීම කිසිසේත් අනුමත නො කළ හැකි ය.

මහමඟ යන පිරිස බලෙන් නවත්වා සංග්‍රහ කරන දන්සල් ක්‍රමයක් පවතින ලෝකයේ එකම රට වන මේ පුණ්‍ය භූමියේ පින්වත්හු ද පින්වත් දූ දරුවෝ ද දැහැමි දන්සලක් ම දී සතුටු සිතින් පින් අනුමෝදන් වෙත්වා ! දෙලොව වැඩ සලසා ගනිත්වා!

## දෙලොවින්ම ලැබෙන සහනය

**ඉධ නන්දති පෙච්ච නන්දති - කතපුඤ්ඤෝ උභයත්ථ නන්දති**
**පුඤ්ඤං මේ කතන්ති නන්දති - භියෝ නන්දති සුග්ගතිං ගතෝ**

පින් කළ පුද්ගලයා මෙලොවත් සතුටු වෙයි. පරලොවත් සතුටු වෙයි. දෙලොවම සතුටු වෙයි. මා විසින් පින් කරන ලදැයි සිතා සතුටු වෙයි. සුගතියට ගිය විට බෙහෙවින් සතුටු වෙයි.

**(ධම්මපදය - යමක වග්ගය)**



# අධ්‍යාපන කාර්යය තුළ සිසු සිසුවියන්ගේ භූමිකාව

**සිරි වජිරාරාමවාසී**
**ශාස්ත්‍රපති පූජ්‍යපාද කුරුණෑගල චරණධම්ම හිමියන් විසිනි.**

අධ්‍යාපනය ලැබීමේදී එහි සාර්ථකත්වය පිණිස ගුරුවරයාගේ මෙන් ම ශිෂ්‍යයාගෙන් ද සුවිශාල කාර්ය භාරයක් ඉටුවිය යුතු ය. ගුරු සිසු දෙපසේ ම කැපවීම, උත්සාහය හා උනන්දුව වඩාත් කාර්යක්ෂම ඉගෙනුම් ක්‍රියාවලියකට හේතු වේ. උගන්වන්නේ කවර විෂයයක් වුවත් එහි මූලික මඟපෙන්වීම ගුරුවරයා විසින් සිදු කළ යුතු වේ. ඒ අනුව ගුරුවරයාගේ පැහැදිලි කිරීම හා මඟපෙන්වීම හොඳින් ග්‍රහණය කර ගත යුතු වේ. ඒ සඳහා සිසුවා තම සවන් දීමේ කුසලතාව කෙසේ වර්ධනය කර ගත යුතු දැයි දැන ගැනීම වැදගත් වේ. යමකට සවන් දීම කෙසේ කළ යුතු ද යන්න පිළිබඳ සමයාගත ඉගැන්වීම් අංගුත්තර නිකායේ සුස්සූසති, මජ්ඣිම නිකායේ සෝතාර ආදී සූත්‍ර ධර්ම කිහිපයක ම අඩංගු වී තිබේ. සූත්‍ර ධර්මවල දී ධර්ම ශ්‍රවණයට අදාළව එම කරුණු දක්වා තිබුණත් ඒවා අපගේ ඉගෙනුම් කටයුතුවල දී අනුගමනය කිරීමේ කිසිදු බාධාවක් දොසක් නොමැත.

ඒ අනුව අපි දැන් සිසුන් තම සවන් දීමේ කුසලතාව කුමන කාරණාවලින් වර්ධනය කර ගත යුතු යන්න සොයා

බලමු. මේ පිළිබඳව කරුණු හයකින් යුතු විස්තරයක් අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ සීති වර්ගයේ එන "සුස්සූසති" සූත්‍රයෙහි සඳහන් වේ.

- න සුස්සූසති - අසන්නට නොපෙළඹීම
- න සෝතං ඕදහති - ඇසුව ද මැනවින් සවන් යොමු නොකිරීම
- න අඤ්ඤා චිත්තං උපට්ඨපේති - දැන ගැනීමට සිත යොමු නොකිරීම
- අනත්ථං ගණ්හාති - වරදවා තේරුම් ගැනීම
- අත්ථං රිඤ්චති - සැබෑ අර්ථය බැහැර කිරීම
- අනනුලෝමිකාය ඛන්තියාය සමන්නාගතෝ හෝති - අනුලෝමික රුචිකත්වයෙන් බැහැර වීම

ශිෂ්‍යයාගේ භූමිකාවෙන් මෙම කාරණා සය පැහැදිලි කර ගතහොත් මෙසේ ය. ගුරුවරයා ඉගැන්වීම සිදු කරන විට එයට කිසිසේත් සවන් නොදීම මෙහි පළමු කාරණාවෙන් අදහස් වේ. ඉගැනුමේ දී ගුරුවරයාට සවන්දීමෙන් තොරව එම ක්‍රියාවලියේ ඉදිරියට යා නොහැකි ය. එම නිසා උනන්දුවෙන් ආශාවෙන් වුවමනාවකින් ගුරුවරයාට සවන්දීමට සිසුවා පුරුදු විය යුතු ම ය. ගුරුවරයාට සවන් නොදී එය මඟ හැරීම වරදකි.

දෙවන කාරණාවෙන් අදහස් වන්නේ සවන්දීමට යොමු වුවත් නිසිලෙස උනන්දුවකින් සවන් නොදීම යි. ඇසෙනවා මිස වුවමනාවෙන් ඇසීමක් නොකරන බව යි. ඉගැනුමෙහි දී වුවමනාවෙන් ඇසීම මිස අවධානයකින්

තොරව කුමක් හෝ ඉබේ ඇසීමේ වැදගත්කමක් නොමැත. ඉංග්‍රීසි භාෂාවේ මෙම කරුණු දෙක වචන දෙකකින් දක්වා ඇති නිසා වෙනස වඩාත් හොඳින් පැහැදිලි වේ. ය්ර - ඉබේ යමක් යමක් ශ්‍රවණය වීම. බසිඑැබ - වුවමනාවෙන් යමක් ඇසීම. අධ්‍යාපන කාර්යයේ දී අවශ්‍ය වන්නේ වුවමනාවෙන් සවන්දීම යි.

තෙවනුව දැනගැනීමට සිත යොමු නොකිරීම යනුවෙන් අදහස් වන්නේ මනස යොමු කරමින් දැන ගැනීමේ වුවමනාවෙන් නොඇසීම යි. සෝතාර සූත්‍රයේ දී දක්වා ඇති ආකාරයට යමක් ඇසීමේ දී යොමු කළ කන් ඇතිව ඇසිය යුතු වේ. යොමු කළ කන් ඇතිව යනු ඉන්ද්‍රියන් සය ම (ඇස, කන, නාසය, දිව, කය, මනස)එක ම අරමුණක එනම් අසන දෙය වෙතට ම යොමු කරගෙන බාහිර අරමුණුවලට අවධානය යොමු නො කොට සවන්දීම යි. සවන්දෙන විට දී යම් විටක නාසයට ගඳක් හෝ සුවඳක් දැනුණ ද අවධානය ඒ වෙතට යොමු නොකොට ඇසීම කෙරෙහි ම පවත්වාගත යුතු ය. වෙනත් බාහිර අරමුණු ආදියට අවධානය යොමු නො කොට ඇසීම ප්‍රධාන කොට සලකාගෙන මනස ඒ තුළම රඳවාගෙන ශ්‍රවණය කළ යුතු බව මෙම සූත්‍රයෙන් අවධාරණය කොට තිබේ. තේරුම් ගැනීමේ උවමනාවෙන් සවන්දීම යන්න මෙහි සරල අදහස යි.

සිවුවැනි ව වරදවා තේරුම් ගැනීම නම් හොඳින් සවන් නොදීම, නිසිලෙස සවන් යොමු නොකිරීම, දැඩි අවධානයක් පවත්වා නොගැනීම යන කරුණු එකක් හෝ කිහිපය ම නිසා ඇති වන ප්‍රතිඵලය යි. ගුරුවරයාගේ

පැහැදිලි කිරීමට ප්‍රමාණවත් අවධානයක් යොමු නොවීම නිසා ඒ පිළිබඳ ව ප්‍රමාණවත් අවබෝධයක් ලැබිය නොහැකි ය. එවිට වැරදි අර්ථ ගැනීම සිදු වේ. වැරදි අර්ථය ගත්විට ඉගැනුම ඵල රහිත ය.

පස්වැන්න සඳහන් අර්ථය බැහැර කිරීම යනු ඉහත සියලු කාරණාවල ප්‍රතිඵලයක් ලෙස වැරදි අර්ථයක් ගත්පසු ලබා ගතයුතු නිවැරදි අර්ථය මනස විසින් නිරායාසයෙන් ම බැහැර කිරීම යි. ඉගැනුම් කාර්යය පියවරෙන් පියවර සාර්ථකව සම්පූර්ණ කළයුතු එකක් බව මින් වඩාත් හොඳින් පැහැදිලි වේ.

අවසාන පියවර අර්ථය බැහැර කිරීම නිසාත් අවශ්‍ය දෙය පිළිබඳ දැනුමක් කුසලතාවක් ශිෂ්‍යයාට නොලැබීම නිසාත් ඉගැනීමේ නිසි ඵල නො ලැබේ. එම නිසාඉගැනුම කෙරෙහි ඇති රුචිකත්වය හීන වී යයි. ඒ අනුව සිසුන් තුළ නිසි ලෙස සවන් දීමේ කුසලතාව ඇති නොවීම ඔවුන් අධ්‍යාපනයෙන් බැහැරවීමට ද හේතුවන බව පැහැදිලි වේ.

මෙම කරුණු හය මඟ හරවා ගනිමින් හොඳින් සවන්දීම, නිසිලෙස සවන්දීම, දැනගැනීමේ වුවමනාවෙන් සවන්දීම, වරදවා තේරුම් නොගැනීම, අර්ථය බැහැර නොකිරීම යන කරුණුවලින් යුතුව සවන්දීමේ කාර්යය පුහුණු කළවිට අධ්‍යාපන රුචිකත්වය ඉබේ ම ඇතිවනු ලැබේ.

එම නිසා සුස්සූසති සූත්‍රයේ අඩංගු මෙම කරුණු සාවධානව කියවා බලා මැනවින් සවන්දීමේ කුසලතාවන් වර්ධනය කරගෙන තම අධ්‍යාපනයෙන් විපුල ඵල නෙළා ගැනීමට අදිටන් කර ගනිමු.



# මච්ඡ ජාතකය

**කොළඹ විශාඛා විදුහලේ විශ්‍රාමලත් ආචාර්යාණි
ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි.**

එක් නියං සමයෙක අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන කල,කොසොල් රටට වැසි නො ලැබීමෙන් වැව් පොකුණු, ඇල දොළසිඳී ගොස් මිනිසුනට මෙන් ම සතුනට ජීවත්වීමට අසීරු කාලයක් උදාවිය. වඩාත් ම අසරණ වූවෝ, පීඩාවට පත්වූවෝජලජ සතුන් වන මත්ස්‍යයින් හා ඉදිබුවෝ ය. අසරණ වූ මෙම සතුන් ගොදුරු කර ගැනීමට අනෙකුත් සත්තු මෙය අවස්ථාවක් කරගත්හ.

දෙව්රම් වෙහෙරට පිවිසෙන දොරටුව අසල වූ දෙව්රම් පොකුණ ද නියඟයට අසු වී සිඳී ගියේ ය. මාළුන් මෙන් ම ඉදිබුවෝ මඩෙහි සැඟ වී සිටීමට උත්සාහ කළහ. නමුත් මෙම සතුන් උකුස්සන්ට, කපුටන්ට ගොදුරු වන ආකාරය දුටු බුදුරජාණන් වහන්සේ අද වැසි වස්සවමි'යි අධිෂ්ඨාන කළ සේක. දෙව්රම් පොකුණට පිවිසෙන පියගැට පෙළදක්වා උන් වහන්සේ වැඩියහ. එහි නැවතී ආනන්ද තෙරුන් වහන්සේ අමතා පැන් සැනහීමට (ස්නානය කිරීමට) නානකඩ රැගෙන එන ලෙස පවසා සිටි සේක. දෙව්රම් පොකුණ සිඳී ඇති බැවින් ස්නානය

කරන්නේ කෙසේ දැයි ආනන්ද තෙරුන් වහන්සේ අප බුදු පියාණන් වහන්සේ වෙතින් විමසා සිටිය හ. එහෙත් බුදුරජාණන් වහන්සේ නානකඩ හැඳ; පියගැට පෙළ මත වැඩ සිට"මහ වැසි වසීවා" යි අධිෂ්ඨාන කරත් ම, සක් දෙවිඳුන්ගේ මෙහෙයවීමෙන් වැස්සවලාහක දෙව් තෙමේ ක්‍රියාත්මක විය.

ඉක්බිති අහස ගුගුරන්නට විය. විදුලි කොටන්නට පටන් ගති. මුනින් අතට හැර වූ පැන් කළයකින් වතුර වැටෙන්නා සේ මහ වැසි වැටුණි. දෙව්රම් පොකුණ පිරී ඉතිරී ගියේ ය. මඩේ සිරවී සිටි මාළු ඉදිබුවෝ පිහිනීමට පටන් ගත්හ. සතුන් මෙන්ම ගස් වැල්, මිනිස්සු ප්‍රීති ප්‍රමෝදයට පත් වූහ. අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ, පැන් සනහා දෙව්රම් වෙහෙරට වැඩි සේක. සවස් වරුවේ දම් සභාවෙහි රැස් වූ භික්ෂූන් වහන්සේලාගේ කතිකාවට බඳුන් වූයේ බුදුරජාණන් වහන්සේගේ කරුණාභරිත බව, මෙන් ම මද ඇසිල්ලකින් වැසි වස්සවා සතුන් මෙන් ම මිනිසුන් සැනසූ ආකාරය යි. මෙම කතිකාවතට සවන් යොමු කළ බුදුරජාණන් වහන්සේ, තමන් වහන්සේ පෙර කල තිරිසන් ආත්මවල දී පවා මේ අන්දමින් ක්‍රියා කළ බැව් වදාළ සේක.

බෝසත්හු ඈත අතීතයේ දී මාළු රැනක නායක ලෙස දිය කඳුරක ජීවත් වූහ. නිල් දියෙන් පිරි දිය කඳුර, නියඟයට අසු වී, සිඳී ගියේ ය. ඇල, දොළ, ගංගා සිඳී ගියේ ය. ගහ කොළ වියළී ගියේ ය. මසුන් මෙන් ම ඉදිබුවෝ මඩෙහි සැඟවුණහ. බෝසත් මත්ස්‍ය නායකයා කෙසේ හෝ තම රැන බේරා ගත යුතු යැයි අධිෂ්ඨාන

කර සත්‍ය ක්‍රියා කළේ ය. එම සත්‍ය ක්‍රියාවේ බලයෙන් වැසි වැටෙන්නට විය. මාළුන්ගේ ඉදිබුවන්ගේ ජීවිත බේරුණි. මිනිසුන්ගේ ජීවිත ප්‍රබෝධවත් විය. මෙසේ මත්ස්‍ය නායකයා ලෙස බුදුරජාණන් වහන්සේ එකල ද සැමට ම කරුණාව දැක්වූහ. සෙත සැලසූහ. බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාවේ බලමහිමය අප හට මච්ඡ ජාතකයෙන් කියා දේ.

එකල මත්ස්‍ය පිරිස අද බුදු පිරිස ය. වැස්ස වලාහක දෙවියෝ ආනන්ද තෙරුන්වහන්සේ ය. මත්ස්‍ය නායකයා තමන් වහන්සේ බව බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

මිනිසුන් ලෙස අප ද අසරණ වූ මිනිසුනට මෙන් ම සතුන්ට ද හැකි අයුරින් උපකාර කිරීමට උත්සාහ කළ යුතු යි. එමගින් අපට නොදැනී ම අපගේ ජීවිත යහපත් වේ.

පන්සාළිස් වසක් කල් මුළු තුන් ලොවට
පෙන්වූ මඟ ලොවී ලොව්තුරු හැම සුවට
පින් පිඩු එ මුනි ගුණ සිහි කොට නිසි ලෙසට
පින්කම් කරමු මෙ වෙසඟ පොහෝ ද සොඳට

**පැළෑණේ සිරි වජිරඤාණ**
**මහානායක මාහිමිපාණන් වහන්සේ**



# A Sonnet for Vesak

**Chathuri Wickramaratne**
University of Houston USA

Over twenty six centuries ago
On this day when the moon’s bright full face glowed
Lord Buddha shared teachings we could follow
To end suffering all existence loathed.
Today in my white dress and ribbon bow
Colorful lanterns and flowers in hand
I walk to temple beneath the moon’s glow
To celebrate Buddha who changed all land.
His birth, His Enlightenment and his death too
Depicted on banners adorned all night
Crowds of people swarming to say “Sadhu”
To appreciate Lord Buddha’s great light.
Practice loving kindness and compassion
Such is my Vesak day resolution.